# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ශ්‍රී ලංකා ඒකාබද්ධ චාටඩ් ලේකම්වරුන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ)

**ශ්‍රී ලංකා ඒකාබද්ධ චාටඩ් ලේකම්වරුන්ගේ ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එම්.එස්. තව්ෆීක් මහතා විසින්
2017 පෙබරවාරි මස 22 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2017 ජනවාරි මස 09 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

**[166 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 11.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

2—PL 05053—225 (2017/02)

# ශ්‍රී ලංකා ඒකාබද්ධ චාටඩ් ලේකම්වරුන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ)

## ශ්‍රී ලංකා ඒකාබද්ධ චාටඩ් ලේකම්වරුන්ගේ ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

*පූර්විකාව.*

"ශ්‍රී ලංකා ඒකාබද්ධ චාටඩ් ලේකම්වරුන්ගේ ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන සහ හඳුන්වනු ලබන ආයතනයක් එම ආයතනයේ සාමාජිකයන් විසින් එකඟ වූ රීති අනුව එකී ආයතනයට සම්බන්ධ සියලු පරමාර්ථ හා කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීමේ කාර්යය සඳහා මෙතෙක් කල් සීමිත සමාගමක් ලෙස 1982 අංක 17 දරන පනතේ සහතික කිරීම යටතේ බලපැවැත්වෙන නීති රීතිවලට අනුකූලව පිහිටුවා තිබූ හෙයින් ද:

එකී ආයතනය පිහිටුවන ලද්දේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද එකී පරමාර්ථ හා කාරණා එකී ආයතනය විසින් මේ දක්වා සාර්ථකව ක්‍රියාත්මක කරනු ලැබ සහ ඉටු කරනු ලැබ ඇති හෙයින් ද, එම ආයතනය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, එම ඉල්ලීම ඉටුකිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය.*

**1.** මේ පනත 2017 අංක      දරන ශ්‍රී ලංකා ඒකාබද්ධ චාටඩ් ලේකම්වරුන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත හඳුන්වනු ලැබේ.

*ශ්‍රී ලංකා ඒකාබද්ධ චාටඩ් ලේකම්වරුන්ගේ ආයතනය සංස්ථාගත කිරීම.*

**2.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දින සිට සහ ඉන් පසුව ශ්‍රී ලංකා ඒකාබද්ධ චාටඩ් ලේකම්වරුන්ගේ ආයතනයේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන ආයතනයට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් ශ්‍රී ලංකා ඒකාබද්ධ චාටඩ් ලේකම්වරුන්ගේ ආයතනය යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු "ICCSSL" යනුවෙන් සඳහන් කරනු ලබන) ආයතනයක් විය යුතු අතර, එකී සංස්ථාපිත නාමයෙන් ඒ ආයතනය විසින් ද එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ සහ එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ ආයතනයට ඇත්තේ ය.

2—PL 004928 -300 (2016/12)

**3.** ආයතනය සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) වරලත් ඒකාබද්ධ ලේකම් ධුරයෙහි ඵලදායී හා සමතුලිත වර්ධනය, කළමනාකරණය, පාලනය හා අනුබද්ධිත ක්ෂේත්‍රයෙහි ඒකාබද්ධ කටයුතු ප්‍රවර්ධනය හා ආරක්ෂා කිරීම;

(ආ) එහි සාමාජිකයන්ගේ වෘත්තීයමය රුචිකත්වය (කැමැත්ත) තත්ත්වය, අයිතිය හා වරප්‍රසාදත් වරලත් ඒකාබද්ධ ලේකම්වරුන්ගේ වෘත්තිය සම්බන්ධයෙන් මහජනතාවගේ කැමැත්තත් ඉහළ නැංවීම හා ආරක්ෂා කිරීම;

(ඇ) ශ්‍රී ලංකාවේ හා වෙනත් ඕනෑම ප්‍රදේශයක සිටින සංස්ථාපිත ප්‍රධානීන්ගේ (වරලත් ඒකාබද්ධ ලේකම්වරුන්) වෘත්තීය නියෝජනය කිරීම;

(ඈ) වරලත් ඒකාබද්ධ ලේකම් ධුරය හා සම්බන්ධ කළමනාකරණය, පාලනය හා වෙනත් සංස්ථාපිත (ඒකාබද්ධ) කටයුතු සම්බන්ධයෙන් උපදෙස් දීම හා මහජන අධිකාරීන් සමග සන්නිවේදනය කිරීම;

(ඉ) වරලත් ඒකාබද්ධ ලේකම් ධුරය සඳහා කළමනාකරණය හා පාලනය සඳහා සුදුසුකම් ලබන්නා වූ වරලත් ඒකාබද්ධ ලේකම්වරුන් සැහෙන ප්‍රමාණයක් සපයා දීමට පහසුකම් සැලසීම;

(ඊ) වරලත් ඒකාබද්ධ ලේකම් ධුරය හා සම්බන්ධිත කළමනාකරණය, පාලනය ආදී දේ සඳහා පාඨමාලා පැවැත්වීම, විභාග හෝ එවැනි වෙනත් දේ මගින් වෘත්තීයමය සුදුසුකම් පවත්වා ගෙන යාම ස්ථාපිත කිරීම;

(උ) වරලත් ඒකාබද්ධ ලේකම් ධුරය හා සම්බන්ධිත මූලධර්ම, නීතිය, ප්‍රායෝගික පුහුණුව හා පර්යේෂණ කටයුතු කළමනාකරණය හා පාලනය ආදී අධ්‍යාපන කටයුතු කෙරේ උනන්දු කරවීම;

(ඍ) ආයතනයෙහි සාමාජිකත්වය සඳහා සුදුසුකම්, සාමාජිකත්වයෙහි අයෝග්‍යතාවය, වෘත්තීයමය පිළිගත් හැසිරීම් රටාව හා ඊට අමතරව ඒවා ආරක්ෂා කිරීම හා පිළිපැදීම ආදී දේ පිළිබඳව නියෝග නිකුත්කිරීම;

(එ) ආයතනයෙහි සාමාජිකත්වයට ඇතුළත් කරගැනීම සඳහා සංවිධානය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලන කටයුතු කිරීම, වරලත් ඒකාබද්ධ ලේකම් ධුරය සඳහා කළමනාකරණය හා පාලනය සම්බන්ධ ක්ෂේත්‍රයන් සම්බන්ධ අධ්‍යාපන කටයුතු හා ප්‍රායෝගික පුහුණු කටයුතු ආරම්භ කිරීම, ආයතනයෙහි සාමාජිකත්වය සඳහා අධ්‍යාපනය ලබා දීමට අනුමත පාඨමාලා, සුදුසුකම් ලැබීමේ විභාග පැවැත්වීම, අධ්‍යාපන කටයුතු වැඩිදුරටත් පවත්වාගෙන යාම හා කාර්ය සාධනය වර්ධනය සඳහා ඒ හා සම්බන්ධ ක්ෂේත්‍රයන්හි පිළිගත් වෘත්තීය ආයතන සමග එක්වී එබඳු පුහුණු පාඨමාලා මෙහෙයවීම, සැපයීම හා විභාග පැවැත්වීම;

(ඒ) වරලත් ඒකාබද්ධ ලේකම් ධුරයෙහි කළමනාකරණය, ඒකාබද්ධ පාලනය හා ඒ සම්බන්ධ ක්ෂේත්‍රයන්හි අධ්‍යාපනය, පුහුණුව, සංවර්ධනය, වෘත්තීයමය සේවා හා මානව තාක්ෂණික සම්පත් සඳහා නිර්ණය කිරීම හා ඒවායේ ප්‍රමිතිය යාවත්කාලීන කිරීම;

(ඔ) ආයතනයට යම් හෙයකින් යොමු විය හැකි හා ඒකාබද්ධ ලේකම් ධුරය හා සම්බන්ධ කළමනාකරණය, පාලනය හා ඒ ආශ්‍රිත කරුණු සම්බන්ධ වූ අර්බුද නිරාකරණය කිරීම; සහ

(ඕ) මහජන රුචිකත්වය ඒකාබද්ධ ආයතනයන්හි රුචිකත්වය මෙන්ම වරලත් ඒකාබද්ධ ලේකම්වරුන්ගේ වෘත්තිය කෙරෙහි නිසි ගෞරවය දැක්වීම.

සංස්ථාවේ බලතල.

**4.** මෙම පනතේ ප්‍රතිපාදනවලට යටත්ව හා වෙනත් ලිඛිත නීතියකට යටත් ව ආයතනයෙහි පොදු අරමුණු වැඩිදුරටත් ළඟා කර ගැනීමේ හා වැඩිදියුණු කිරීමේ අයිතිය ආයතනය සතු වේ—

(අ) ආයතනයෙහි අරමුණු හා ක්‍රියාකාරකම්වලට ගැළපෙන පරිදි ශ්‍රී ලංකාවේ හෝ පිටරටවල වෙනත් පුද්ගලයින් ඒජන්තවරුන්, සංවිධානයන් ආදිය සමග සම්බන්ධතා ඇති කර ගැනීම, සහාය දීම, සහයෝගය දීම, සහයෝගය ලබා ගැනීම ආදී වශයෙන් සහයෝගීතාවය ගොඩනැගීම;

(ආ) ආයතනයෙහි විභාග කටයුතු හෝ වැඩසටහන් සඳහා සාමාජිකත්වය වෙනුවෙන් බද්දක්, දයකත්වයක් හෝ පරිත්‍යාගයක් නියම කිරීම;

(ඇ) වරලත් ඒකාබද්ධ ලේකම් ධුරයෙහි කළමනාකරණය, පාලනය හා සම්බන්ධිත විෂයයන් පිළිබඳව ප්‍රායෝගික දැනුම ලබා දීම, ප්‍රචාරක කටයුතු, දේශන සංවිධානය හා සම්මන්ත්‍රණ මගින් දැනුම ව්‍යාප්ත කිරීම;

(ඈ) වරලත් ඒකාබද්ධ ලේකම් ධුරයෙහි කළමනාකරණය හා පාලනය යන ක්ෂේත්‍ර සඳහා වන ජයග්‍රහණ වෙනුවෙන් ත්‍යාග, ශිෂ්‍යත්ව ප්‍රදනය, සම්මාන ප්‍රදනය ආදිය ඇති කිරීම;

(ඉ) ආයතනයෙහි අරමුණුවල පැවැත්ම සඳහා යම් දේපළක් ස්ථාපිත කිරීම;

(ඊ) එහි අරමුණු වැඩිදියුණු කිරීම හා සම්බන්ධිත කරුණු පිළිබඳව පර්යේෂණ කිරීම හා සංවර්ධනය කිරීම ඍජුවම හෝ අනෙකුත් අය සමග එක්ව් විධිමත් ව සකස් කිරීම හෝ මෙහෙයවීම;

(උ) ආයතනයෙහි අරමුණුවලට අවශ්‍ය විය හැකි හෙයින් වෘත්තීය උපදෙස් පතන පුද්ගලයන්හට උපදෙස් දීම සඳහා ආයතනයෙහි අරමුණු ළඟාකර ගැනීමේ හෝ වැඩිදියුණු කිරීමේ කරුණු හා සම්බන්ධ වන ආයතනයට උපදෙස් දීමේ අරමුණින් හෝ කාර්යසාධනය හා බලතල හා ක්‍රියාකාරීත්වය ඉටුකිරීමේ ව්‍යායාමය සඳහා හෝ උපදේශක කමිටුවක් පත් කිරීම;

(ඌ) සේවක පත් කිරීම, මාරුකිරීම, සේවා මාරුවීම් හා සේවයෙන් පහකිරීම සඳහා නිලධාරින් පත් කිරීම, සේවකයින් පත් කිරීම හා ඔවුන්ගේ සේවා වාර හා කොන්දේසි නිර්ණය කිරීම;

(එ) ආයතනයේ අරමුණු හා කොන්දේසි මත සුදුසු යැයි හැඟේ නම් ආරක්ෂණයක් ඇතිව හෝ නොමැතිව අවශ්‍ය වන මුදල් ණයට ගැනීම හා සාමාජිකයන් වෙනුවෙන් ණයට හෝ අත්තිකාරම් වශයෙන් දීම හෝ ආයතනය සතු ඕනෑම දේපළක් ආයතනයේ නීතිරීතිවලට යටත් ව ණයට හෝ අත්තිකාරම් වශයෙන් ලබා දීම;

(ඒ) ආයතනයෙහි අරමුදල් ආයෝජනය කිරීම, පරිපාලන අරමුදලක් ඇති කිරීම හා ඕනෑම බැංකුවක හෝ මූල්‍ය ආයතනයක ජංගම හෝ වෙනත් ගිණුමක් පවත්වාගෙන යාම;

(ඔ) ආයතනයේ අරමුණු උදෙසා ඕනෑම චංචල හෝ නිශ්චල දේපළක් විකිණීම, උකස් කිරීම, අන්සතු කිරීම නැතහොත් හුවමාරු කිරීම, විකිණීම, හිලවු මත උකස් කිරීම, කුලියට දීම හෝ බද්දට දීම, බද්දට ගැනීම, රඳවාගැනීම ආදිය කළ හැකි වන්නේ ය;

(ඕ) ඕනෑම ත්‍යාගයක්, ප්‍රදානයක් හෝ උරුමයක් පිළිගැනීම හා ඕනෑම අරමුදලක් පවත්වා ගෙන යාම හා ආයතනය විසින් සුදුසු යැයි හැඟේ නම්, ඕනෑම හේතුවක් සඳහා ආධාර කිරීම හා සමාජ වගකීම් කටයුතු පවත්වා ගෙන යාම; සහ

(ක) අවශ්‍ය නම් ආනුෂංගික වශයෙන් උපකාරීවන ආයතනයෙහි අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීම සඳහා සියලු නීත්‍යනුකූල දේ කිරීම හා ආයතනයෙහි බලතල පාවිච්චි කිරීම.

**5.** (1) පනතේ ප්‍රතිපාදනවලට යටත් ව ආයතනයෙහි කටයුතු සම්බන්ධයෙන් කළමනාකරණය, පරිපාලන කටයුතු, නීති සැකසීම ආදී කටයුතු කළමනාකරණ මණ්ඩලයක් යටතට පවරා ගැනීම (මින් පසුව "කළමනාකරණ මණ්ඩලය" ලෙස හඳුන්වනු ලබන). සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

(2) කළමනාකරණ මණ්ඩලයට සභාපති, ලේකම් හා කාරක සභික නිලධාරීන් ඇතුළත් වන අතර, මෙම පනතේ 10 වන ඡේදයෙන් සැපයෙන ප්‍රතිපාදනවලට අනුව කළමනාකරණ මණ්ඩලයට සභාපති හා ලේකම් ඇතුළු කාරක සභික නිලධාරීන් පත් වන්නේ ය.

(3) මෙම පනත ආරම්භවීමට පෙර දිනයේ සිටම මෙම ආයතනයෙහි පළමු කළමනාකරණ මණ්ඩලයට සාමාජිකයන් ඇතුළත් වන අතර, ඔවුන් මෙම පනත ආරම්භයේ සිටම කළමනාකරණ මණ්ඩලයේ නිලතල දරන්නේ ය.

**6.** (1) කළමනාකරණ මණ්ඩලය විසින් සාමාජිකයන්ගේ නාම ලේඛනයන් පවත්වාගෙන යන අතර, ආයතනයෙහි සෑම පුද්ගලයකුගේම නම අදාළ කාණ්ඩයෙහි නියමිත අයුරින් සාමාජිකත්ව ලේඛනයෙහි ඇතුළත් කරනු ලබයි. සාමාජිකත්වය.

(2) මෙම පනත ආරම්භ වීමට පෙර දිනයේ සිට සිටි සෑම දෙනාම ICCSSL හි සාමාජිකයෙක් වන අතර, ඔවුන් ආයතනයෙහි අදාළ කාණ්ඩයෙහි සාමාජිකයකු ලෙස සලකනු ලැබේ.

**7.** කළමනාකරණ මණ්ඩලයට යොමු කරන ලද කාරණා සම්බන්ධයෙන් වරින් වර හෝ වෙනත් ආකාරයකින් හෝ උපදෙස් දීමට හෝ නිර්දේශයන් දීමට ආයතනයෙහි කවුන්සලයක් පවතී. කවුන්සලය.

මෙම කවුන්සලය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විතය. ඔවුන් තෝරා ගැනීම හෝ පත්කිරීම ආයතනයේ පනතෙහි ප්‍රතිපාදනවලට අනුව සිදු කෙරේ—

(i) මණ්ඩලයේ සාමාජිකයින්; සහ

(ii) පහත සඳහන් සෑම ආයතනයකින්ම වාර්ෂිකව නියෝජිතයෙක් පත්කර ගැනීමට කළමනාකරණ මණ්ඩලය විසින් ආරාධනා කරනු ලබන අතර, ඔවුන් වසරක කාලයක් සඳහා කළමනාකරණ මණ්ඩලය විසින් පත්කරනු ලබන්නේ ය:—

(අ) කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයෙන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ නියෝජිතයකු;

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ නියෝජිතයකු;

(ඇ) සමාගම් රෙජිස්ට්‍රාර්වරයා හෝ ඔහු විසින් නම් කරන ලද අයෙක්; සහ

(ඈ) මෙම නියෝජිතයන් එක් වසරක නිල කාලය බැගින් මාරුවෙන් මාරුවට නිල කාලය දරන අතර, පහත සඳහන් තනතුරු දරන අයගෙන් එක් නියෝජිතයෙක්:

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ ගණකාධිකාරිවරුන් (ICASL) හි හෝ ශ්‍රී ලංකාවේ සහතිකලත් ගණකාධිකාරි කළමනාකාර සංගමයේ (CMA) හි නියෝජිතයෙක්.

නිල නාමය හා අක්ෂර නිල නාමය භාවිතය.

8. (1) මෙම පනත යටතේ දැක්වෙන නියමයන්ට අනුව නිර්දේශිත වූ සුදුසුකම්ලත් සෑම සාමාජිකයෙක්ම ආයතනයෙහි "වරලත් ඒකාබද්ධ ලේකම්වරුන්" යන නිල නාමය භාවිතයට සුදුසුකම් ලබනු ඇත.

(2) ආයතනයෙහි සෑම සමකාලීන (සමගාමී) සාමාජිකයකුම සමකාලීන වරලත් ඒකාබද්ධ ලේකම්වරයා හා FCCS යන අක්ෂරවලින් දැක්වෙන නිල නාමය භාවිතයට සුදුසුකම් ලබන්නේ ය.

(3) ආයතනයෙහි හවුල් සාමාජිකයකු ලෙස ලියාපදිංචිය ලත් සෑම සාමාජිකයකුම ආශ්‍රිත වරලත් ඒකාබද්ධ ලේකම් යන නිල නාමය හා ACCS යන අක්ෂරවලින් දැක්වෙන නිල නාමය භාවිත කිරීමට සුදුසුකම් ලබන්නේ ය.

**9.** (1) ආශ්‍රිත සාමාජිකයකු හෝ සමකාලීන සාමාජිකයකු නොවන එක්සත් රාජධානියේ වරලත් ලේකම්වරුන්ගේ හා පාලකයින්ගේ "වරලත් ලේකම්", "වරලත් ඒකාබද්ධ ලේකම්" යන නිල නාම හෝ පනතේ අවසරලත් වෙනත් ආකාරයකින් වැරදි මග පෙන්වීමකින් සමානකමක් දක්වන්නා වූ නිල නාමයන් කිසිදු සාමාජිකයකුට භාවිත කළ නොහැක්කේ ය. තනතුරු නාමය භාවිත කිරීම පාලනය කිරීම.

(2) සමකාලීන සාමාජිකයකු වශයෙන් ආයතනයේ ලියාපදිංචි නොවූ අයකුට සමකාලීන වරලත් ඒකාබද්ධ ලේකම් වන නිල නාමය හා FCCS යන අක්ෂරවලින් දැක්වෙන තනතුරු නාමය භාවිත කළ නොහැකි වන්නේ ය.

(3) ආශ්‍රිත සාමාජිකයකු වශයෙන් ආයතනයේ නොවූ අයකුට ආශ්‍රිත වරලත් ඒකාබද්ධ ලේකම් යන නිල නාමය හා ACCS යන අක්ෂරවලින් දැක්වෙන තනතුරු නාමය භාවිත කළ නොහැකි වන්නේ ය.

(4) පළමු උපවගන්තියට කිසිදු විරෝධයක් නොදක්වමින් වරලත් ලේකම්වරුන්ගේ හෝ වරලත් ඒකාබද්ධ ලේකම්වරුන්ගේ සමාගමෙහි ඕනෑම සංගමයකට මෙම ආයතනයෙහි සාමාජිකයන් වන ඕනෑම කොටස්කරුවකුට වරලත් ලේකම්වරුන් යන නිල නාමය භාවිත කළ හැක.

**10.** (1) පහත සඳහන් සියලු කරුණු හෝ ඇතැම් කරුණු සම්බන්ධයෙන් වරින් වර පවත්වන මහා සභා රැස්වීමක දී පැමිණි සංඛ්‍යාවෙන් 2/3 කට නොඅඩු ඡන්ද සංඛ්‍යාවක් සහිතව පනතේ විධිවිධානවලට හා වෙනත් ලිඛිත නීතියකට අනනුකූල නොවන පරිද්දෙන් නීති සෑදීම ආයතනය සඳහා නීත්‍යනුකූල වන්නේය:— සංස්ථාවේ රීති.

(අ) සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීම, නෙරපීම, ඉවත්වීම, ඇතුළුවීම, ආදී ක්‍රියාවලීන් සඳහා සෑම පංතියකම සාමාජිකයින් වෙනුවෙන් ගෙවිය යුතු ගාස්තු සඳහා ක්‍රියා පිළිවෙළක් අනුගමනය කිරීම;

(ආ) කළමනාකරණ මණ්ඩලය හා කවුන්සලය සඳහා නිල කාල සීමාවකින් ඉල්ලා අස්වීම, බලයෙන් පහ කිරීම (කාරක සභික) තනතුරු හැරයාම හා බලතල, රාජකාරි හා කාර්යසාධනය ආදිය සම්බන්ධයෙන් ව්‍යවස්ථාවක් හා ඡන්දයක් පැවැත්වීම;

(ඇ) ආයතනයෙහි විවිධ නිලධාරින්ගේ, ඒජන්තවරුන්ගේ හා සේවකයන්ගේ බලතල, රාජකාරි ක්‍රියාත්මක වීම හා ඔවුන්ගේ පත්වීම, පාරිතෝෂිකය විනය කරුණු, සේවයෙන් පහකිරීම හා නිල කාලය අවසන් කිරීම ආදිය;

(ඈ) ආයතනයෙහි හා කළමනාකරණ මණ්ඩලයේ හා කවුන්සලයේ කැඳවීම හා රැස්වීම් පැවැත්වීම, උප කමිටු සම්බන්ධව හා ගණපූරණය හා රැස්වීම් කටයුතු මෙහෙයවීම;

(ඉ) කළමනාකරණ මණ්ඩලය හා කවුන්සලය සඳහා සාමාජිකත්වයෙහි සුදුසුකම හා නුසුදුසුකම්;

(ඊ) ආයතනයේ දේපළ පරිපාලනය හා කළමනාකරණය; සහ

(උ) ආයතනයෙහි සාමාන්‍ය කළමනාකරණය සම්බන්ධ කටයුතු.

(2) ආයතනයෙහි නීති සංශෝධනය, වෙනස් කිරීම, එකතු කිරීම හෝ අහෝසි කිරීම වැනි දෑ මෙම ඡේදයේ සඳහන් වන පරිදි නීතියක් සකස් කරන ආකාරයෙන් ම කළ හැකි වීම.

(3) වරින් වර ඉදිරියේ දී ආයතනය විසින් සකස් කරන හා අනුගමනය කරන නීතිවලට යටත්වීමට සෑම සාමාජිකයකුටම සිදු වේ.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**11.** යම් මිලට ගැනීමකින්, ප්‍රදානයකින්, ත්‍යාගයකින්, තෙස්තමේන්තු බැහැර කිරීමකින් හෝ වෙනත් යම් ආකාරයකින් හෝ පදනම වෙත සතු කරනු ලබන යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙන් බලය හා හැකියාව ඇති අතර, එකී සියලු දේපළ පදනම විසින් මේ පනතේ කාර්ය සඳහා දැරිය යුතු ය. තව ද, පදනමේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව එකී දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ද පදනම සතු වන්නේ ය.

සංස්ථාවේ අරමුදල.

**12.** (1) මෙතැන් සිට හෝ මින් ඉදිරියට මෙම ආයතනයට තෑගි, ආධාර, ප්‍රදාන, උරුමයන් ආදී වශයෙන් ලැබෙන සියලු මුදල් එසේ නැතහොත් ආයතනයේ ගිණුමක් මගින් ලැබෙන සියල්ල ආයතනයේ

ගිණුමට බැරවන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක හා මූල්‍ය ආයතනවල කළමනාකරණ මණ්ඩලය තීරණය කරන පරිදි තැන්පත් කරනු ලැබේ.

(2) එක් වසරක සිට අනික් වසර අතර බණ්ඩනය වීමක් සිදුනොවී මාස 12 කැලැන්ඩර මාස ක්‍රමයට අනුව එක් වසරක සිට අනෙක් වසර දක්වා මුදල් වර්ෂය අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබේ.

ගිණුම් හා විගණනය.

**13.** (1) දේපළ වත්කම් හා වගකීම් වෙනත් ගනුදෙනු කටයුතු (ආදායම් - වියදම්) ආදිය බැංකු ගිණුම් පොත් පත්හි ආයතනය විසින් ගිණුම්ගත කරනු ලැබේ.

(2) අවම වශයෙන් සෑම මුදල් වර්ෂයකටම වරක් ආයතනයෙහි ගිණුම් විගණන පරීක්ෂණයකට යොමු කෙරේ.

(3) ගිණුම් විගණනය කරනු ලබන්නේ සුදුසුකම්ලත් විගණකවරයකු හෝ සමාගමක් විසිනි.

(4) මේ ඡේදයේ "සුදුසුකම්ලත් විගණකවරයා" යනුවෙන් අදහස් කරන්නේ නීතිමය වශයෙන් පිළිගත් දැනට ප්‍රායෝගිකව සමාගම් හා සංස්ථාවල ගිණුම් විගණන කටයුතුවල නියැලෙන තනි පුද්ගලයකු හෝ වෘත්තීය වශයෙන් කටයුතු කරන විගණන සමාගමක් වේ.

(5) කළමනාකරණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාවෙහි මුදල් වර්ෂය සඳහා අදාළ වන ගිණුම් ප්‍රකාශනය, ආයතනයේ ශේෂපත්‍රය හා විගණකවරයාගේ වාර්තාව ඇතුළත් කරනු ලබන්නේ ය.

සංස්ථාව විසින් ගෙවිය යුතු සහ සංස්ථාවට අයවිය යුතු ණය.

**14.** මෙම පනත ආරම්භයට පෙර දින සිට පැවැතෙන සියලු ණය හා වගකීම් ආයතනය මගින් ගෙවා දැමීම හෝ නිදහස් කිරීම සිදු කරන අතර, ලැබීමට නියමිත ණය, දයකත්ව මුදල් හා ICCSSL සඳහා එදිනට ගෙවීමට නියමිත ගාස්තු ආදිය පනතේ පරමාර්ථ සඳහා ආයතනයට ගෙවනු ලබන්නේ ය.

නීතිපතිවරයා, බැංකුකරුවා, නියෝජිතයෝ.

**15.** කළමනාකරණ මණ්ඩලය විසින් නීතිපතිවරයා, ආයතන බැංකුකරුවා මෙන්ම ඕනෑම ඒජන්තවරයකු ආයතනයේ අවශ්‍යතාවය පරිදි පත් කරන අතර, එම පත් කිරීම් ඕනෑම වේලාවක අහෝසි කිරීම ද කරනු ලබයි.

සංස්ථාවේ මුද්‍රාව.

**16.** පදනමේ මුද්‍රාව පදනමේ සාමාජිකයන් දෙදෙනෙක් ඉදිරිපිට දී හැර කවර වූ හෝ සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, එකී තැනැත්තන් තමන් පැමිණ සිටින බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. තව ද එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**17.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් විසින් ඔවුන් යටතේ හිමිකම්පාන තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**18.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.